# විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ

## පරිගණක මෘදුකාංග සංවර්ධක තනතුර (Java/Angular) සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පරිගණක මෘදුකාංග සංවර්ධක තනතුරට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ ක්‍රමය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක හා වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල අනුව බඳවාගනු ලැබේ.

02. **අවශ්‍ය සුදුසුකම්**

I. **අධ්‍යාපන සුදුසුකම් :**

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම

හෝ

(2) i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් සහිත උපාධියක් ලබා තිබීම. (මෙහිදී සම්පූර්ණ උපාධියෙන් අවම වශයෙන් 1/3 කොටසක් පරිගණකවිද්‍යාව තොරතුරු තාක්ෂණය පිළිබඳව විය යුතුය)

සහ

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම

හෝ

(3) i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උපාධියක් ලබා තිබීම

සහ

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

II. **වෘත්තීය සුදුසුකම්**

පරිගණක මෘදුකාංග සංවර්ධනය සම්බන්ධව වෘත්තීය සුදුසුකම්

- Java Enterprise Development, Javascript, MS SQL, MYSQL තාක්ෂණික භාවිතයන්හි ඇති හැකියාව හා පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

03. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි**

වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගනු ලැබේ.

04. **වයස් සීමාව**

ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 40ට නොවැඩි විය යුතුය.

05. **මාසික දීමනාව**

රු.60,000/=ක මාසික දීමනාවක් ගෙවනු ලබන අතර, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ දායකත්වය ලබාගත යුතුය.

06. **අයදුම්පත් ඉදිරිපත් කිරීම**

අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **"විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පරිගණක මෘදුකාංග සංවර්ධක තනතුරට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතු අතර, අයදුම්පත් 2020.09.15 දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,**
**විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,**
**මාළිගාවත්ත, කොළඹ 10.**

07. අයදුම්පතෙහි ආකෘතිය, ලකුණු දීමේ පරිපාටිය හා වැඩි විස්තර සඳහා http://www.pensions.gov.lk වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

08. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සතුවේ.

**විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,**
**විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,**
**කොළඹ 10.**

Source: Dinamina, Daily News (2020.08.31)